උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 13

ඇමෙරිකාවෙන් ආවට පස්සෙ ගතවුණු අවුරුදු දහය සිනමාව වෙනුවෙන්ම ගෙවුණු නිසා කර්මාන්තය ඇතුළෙ නව ප්‍රවණතා කිහිපයක් මතු කරන්නත් ඒවා ගොඩ නගන්නත් මට පුළුවන් වුණා. සිනමා තරු කියන සංකල්පය සමාජයෙන්

අතවරයි ඇර වෙන ඕන මගුලක් ගැන තිරපටපත ලියපං හොඳේ. මට දැන් යුද්ධෙ ගැනයි, ගාමන්ට් ගැනයි හදපු චිත්‍රපටි බලලම ඇතිවෙලා”

කරන අතරෙ මං වෙනුවෙන් කථා කරා.

“ආ ඇත්තද. කොහොමත් මේක ලියලා ඉවර-වෙද්දි මචං උඹ රඩ් මහත්තයට බෑනණ්ඩි වෙලා ඉදි නේද”

නිල්හාන් අන්තිම කෙසෙල් කෑල්ල කාලා ලෙල්ල පිඟාන උඩ තියන ගමන් කිව්වා.මං චිල්ල කරපු පාන්වාටි ප්‍රහාරයෙන් බේරෙන්න උඩුකය මඳක් පිටුපසට කරපු නිල්හාන් බිම වැටුණු පාන්වාටිය අහුලල හිස් පිඟාන මත තිබ්බා.

“ඇමෙරිකන් කෙල්ලන්ට උඹේ විශේෂ කැමැත්තක් තියෙනවනෙ. ඒකයි මං කිව්වෙ. කොහොමටත් දැන් උඹට නිකං කන්න බො-න්න දීලා නඩත්තු කරන්න ගිහින් මාව බංකොලොත් වේගෙන එන්නෙ. ඒ නිසා ඉක්මනට කාව හරි එල්ලගෙන කුඩුවෙයං.අර නොදන්න දේශපාලනයක් කරන්න ගිහිං

නිකට දබරැඟිල්ලෙන් වැරෙන් ඔසවන ගමන් ඇහුවා. ඒ ඇස්වලින් බේරුණු කඳුළු මේසෙ මත අතුරලා තිබුණු අමුරෙදි මතට වැටිලා ඒ අතරෙ නොපෙනීගියා.

“අපි යං සසංකව බලලා එන්න” මට ඉබේටම කියවුණා.
“නිල්හාන් එච්චර කැමති නැහැ” ආර්තී හඬ බාල කරලා කිව්වා.
“එයා කැමතිවෙයි.අඬන්නැතුව ඉන්න.අපි මේ ඉරිදා යං”

සසංකත් දරුණු අතුනුබහන් පිළිකාවකින් පෙළෙන බව දැනගත්තම මට දැනුණු හැඟීම විස්තර කරගන්න රූප රාමු ගනනා-වක් තිබුණත් මදි.චත්‍රා ඒ වෙද්දි දරුවත් එක්ක පදිංචිවෙලා හිටියෙ මාතලේ වුණාට සසංකව බලන්නවත් ගිහිං තිබුණෙ නැහැ. සසංක කොහොමටත් චත්‍රාව විවාහ

## මට දැන් යුද්ධෙ ගැනයි. ගාමන්ට් ගැනයි හදපු චිත්‍රපටි බලලම ඇතිවෙලා”



ඈත්වෙමින් තියෙන කාලෙක තරු ලක්ෂණ දරන නවක නළු නිළියො කිහිප දෙනෙක්ම කේෂේත්‍රයට හඳුන්වා දෙන්න මගේ වෘත්තාන්ත චිත්‍රපටි හරහා මං උත්සාහ ගත්තා. සැබෑ දක්ෂතා තිබුණු ඇතැම් අළුත් මුහුණු වෘත්තීය ගරුත්වය ආරක්ෂා කරගන්න තරං උවමනාවක් නැති කම නිසා නිස්කාරණේ නොමග ගියා. තවත් රිදීතිරංගනාවො දෙන්නෙක් තුන්දෙනෙක්ම මගේ ජීවිතේ හරහා සුළං කෝඩ වගේ ගසාගෙන ගියත් දූලිනිගෙ වියෝවෙන් හිස්වුණ මගේ පෙමාතුර හැඟුම් පුබුදුවන්න තරමට ඒවා සුළි සුලිං වුණේ නැහැ. මගේ තුන්වෙනි චිත්‍රපටිය “ අව පස අහස” සිනමා කරුවෙක් හැටියට මාව අන්තර්ජාතික තලයට ඔසවා තබද්දී මහාචාර්ය රඩ්ගෙ දියණිය ජූලියානා හවුල් චිත්‍රපටියක් කරන්න මාව උනන්දු කරා. අව පස අහස ලංකාවෙ සිනමාහල් වල තිරගත වෙන්නට පෙර යුරෝපා සිනමා උළෙලට ඉදිරිපත් කරන්නට මාව දිරිගැන්-වූයේ ඇයයි.එහිදී චිත්‍රපටියේ ප්‍රධාන චරිතය නිරූපණය කරපු අසේකා අධිකාරි  දක්ෂතම නිළිය ලෙසටත්, ආර්තී දක්ෂතම ඇඳුම් නිර්මාණ ශිල්ප-ණිය ලෙසටත් , නිර්මාණාත්මක සිනමාපටය ලෙස ජූරියේ විශේෂ සම්මානය ත් අපේ චිත්‍රපටියට ලැබුණා. මේ වෙද්දි ජූලියානා යි මමයි අපේ අළුත් නිර්මෘණය වෙනුවෙන් තිරපිටපත සකස් කරමින් හිටියෙ.දිනපතා විද්‍යුත් ලිපි සෑහෙන ප්‍රමාණයක් අපි අතර හුවමාරු වුණා තිරපිටපත අපි දෙ-දෙනාම සෑහීමකට පත්වෙන තත්ත්වයට පත්වෙන තුරුම.

“මචං මේ ලංකාවෙ පශ්චාත් යුධ සමයයි, ලංකීය කාන්තාව ඇඟළුම් කර්මාන්තය තුලදී ලක්වන


උපේක්ෂා සේනානායක
ලියයි


අතුල උපසිරි කල්දෙමුල්ල ගේ
සිතුවමින්

දවසක් උදේ කෑම මේසෙදි නිල්හාන් කිව්වා. අන්තර්ජාතික සම්මාන බලාපොරොත්තුවෙන් ඇතැම් සිනමාකරුවන් ලංකාවෙ අභ්‍යන්තර අර්බුධ සහ සංස්කෘතික විශමතා අනවශ්‍ය ලෙස ලෝකයා හමුවේ විවේචනයට ලක්කිරීම සම්බන්ධයෙන් නිල්හාන් හිටියෙ අප්‍රසාදයෙන්.

“මේක එහෙම කථාවක් නෙමේ. ඉඳුවරලා මේ පාර ලියන්නෙ ගියපාර සාහිත්‍ය සම්මාන උළෙඳේ සම්මාන නොලැබී ගිය පොත ආශ්‍රයෙන්. ඒ පොතේ නිවැරදිව පෙන්නලා තියෙනවා ලංකාවෙ වාර්ගික අර්බුදය ඇතිවෙන්න හේතු සහ ලංකාවෙ දේශපාලනය මෙහෙයවන්න අතයොමන්නෙ කව්ද වගේම ඒ විදේශ බලපෑම් ඔස්සේ සාමාන්‍ය ජනතාව මොන තරං පීඩනයට ලක්වෙනවද කියන එක. ඇත්තම කිව්වොත් රාජ්‍ය නොවන සංවිධාන වල සැබෑ තත්තවය සාමාන්‍ය මිනිස්සුන්ට පෙන්නන්නයි ඕනෙ”

ආර්තී සෝදන බේසමේ ගොඩ ගැසුණු තේ කෝප්ප පිරිසිදු

ඇපත් නැති කරගත්ත නිළිබට්ටිත් නරකම නෑ මචං.ඒකි මේලඟදිත් සිනමා පත්තරේකට කියලා තිබ්බා උඹේ චිත්‍රපටියෙ වැඩ කරපු කාලෙ එයාට දැනුණෙ එයා සිනමාපාසලකට ගියා වගේ කියලා”

නිල්හාන් ගැහැණු හඬක් ආරෝපණය කරගෙන ඒ දෙබස කියපු විදියට ආර්තීට හොඳටම හිනාගියා. නිල්හාන් විතරක් නෙමේ අපේ අම්මයි අප්පච්චියිත් තනුරක්කයිත් හැමවෙලේම විවාහයක් ගැන මට බලකලත් ආර්තී කවදාවත් ඒ ගැන කිසිදෙයක් කිව්වෙ නැහැ. දවසක් අපි දෙන්නා මැද සාලෙ මහමේසෙ උඩ තියං මගේ අළුත් චිත්‍රපටියට ඕනෙ කරන ඇඳුම් කිහිපයක් කඩදාසි වලින් කපන අතරෙ ආර්තී විශේෂයෙන් යමක් කියන්න උත්සාහ කරන බව මට තේරුණා.
“මල්ලිට අසනීපයි කියලා මට ගෙදර වැඩට ඉන්න ගෑණුකෙනා කථා කරලා කිව්වා.”
ආර්තිගෙ මුහුණ බිමට බරවෙලා තිබුණු නිසා ඒ මුහුණෙ හැඟුම් කියවන්න මට අසීරු-වුණා.ඒත් කටහඬ දියවෙලා තිබුණා.

“ගැටඹෙ බාප්පගෙ අසනීපෙද” මං ආර්තිගෙ

කරගත්තෙත් නැහැ. මංගලී අර පාළු වලව්වෙ සසංක එක්ක ජීවත්වුණා. සසංකගෙ අසනීප තත්තවය නරක අතට හැරෙනකං ආර්තීටවත් ඒ ගැන නොකියා ඉන්න මංගලී උත්සාහ කළා.

එලඹුණු ඉරිදා උදේන්ම දරුදෙන්නව නිල්හ-ාන්ගෙ මහගෙදරට බස්සවලා අපි තුන්දෙනා ගැටඹෙ වලව්වට ගියා. බාප්පගෙ මරණෙන් පස්සෙ පලවෙන් වතාවට තම ා මං එදා එහේ ගියේ. වලව්වෙ තාප්පෙ පැත්තක්ම කඩාවැටිලා තිබුණා. කුස්සිය පැත්තෙ ඉඳන් දුවගෙන ආපු කෙසඟ බලුකුක්කෙක් අපේ වාහනේ දැකලා බුරන්න ගත්තා. මංගලී ආවිත් බල්ලව මෙල්ල කරගත්තට පස්සෙ අපි ගරාවැටුණු ඉස්තෝප්පුවට ගොඩවුණා. මේ දිරන වලව්ව උකසින් බේරගන්න දූලිනිගෙ ජීවිතේ අපායක් කරපු මංගලී වැහැරිලා වියපත්වෙලා හිටියෙ තමං කරපු කර්ම පළදීපු ගානට. මගේ ඇතුලාන්තෙ හිරිවැටිලා තිබුණ නිසා මං හිටියෙ කිසිවක් කථාකරගන්න බැරි තරමට මානසිකව ඔද්දල්වෙලයි.

**මතු සම්බන්ධයි**